# ථීන මිද්ධ: පර්‍යාය දේශනාව පිළිබඳ විමර්ශනයක්

- බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි

ථීනය හා මිද්ධය විවිධ පර්‍යායයෙන් විග්‍රහ වී ඇත. එහි දී ථීනය හා මිද්ධය වියුක්ත - විශ්ලේෂී ප්‍රස්තුතයක් ලෙස සේම සංයුක්ත සංශ්ලේෂී ප්‍රස්තුතයක් ලෙස ද දක්වා ඇත. එහි දී ථීනමිද්ධ යන වචනවල අර්ථ ක්‍රියාකාරීත්වය අනුව විවිධ නම් භාවිත කළ බව පෙනේ. මෙහි දී අප අධ්‍යයනය කරන්නේ ථීන මිද්ධ පිළිබඳ සූත්‍ර සාහිත්‍යය තුළ දක්නට ලැබෙන විස්තර විභාගයන් ය. පර්‍යාය යන්නෙන් අදහස් කරන්නේ කාරණා - කරුණු විස්තර යන්න යි. **"පරියාය"** යන ශබ්දය අර්ථ 3 ක යෙදෙයි.[1]

1. **'දේශනාව'** යන අර්ථය දැක්වීමට:

   මෙම දේශනාව මධු පිණ්ඩික දේශනාව ලෙස මතකයේ තබාගන්න. යන මෙහි දී "පරියාය ශබ්දය" "දේශනාව" යන අරුතින් භාවිත ව ඇත.[2]

2. **වාරය, අවස්ථාව** යන අර්ථය දැක්වීමට

   ආනන්ද, අද භික්ෂුණීන්ට දේශනා පැවැත්වීමේ වාරය නියමිතව ඇත්තේ කාහට ද?[3]

3. **කාරණා - අදහස්** යන අර්ථය දැක්වීමට

"ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේගේ භික්ෂු සංඝයාගේ අවබෝධය පහසු වන ආකාරයේ වෙනත් කරුණක්/ අදහස් ඇතුළත් දේශනාවක් වදාරන්නේ නම් වටී.[4]



ඒ අනුව මෙම තෙවනුව දැක්වූ අර්ථය වන **කරුණු, අදහස්** යන අරුත වහනය පිණිස පරියාය ශබ්දය මෙහි භාවිත ය. පරියාය යන්නෙන් ථීන මිද්ධය පිළිබඳ විවිධ කරුණු ඇතුළත්, අදහස් ඇතුළත් දේශනාව යන්න මෙහිදී විශ්ලේෂණය කෙරේ. ථීනමිද්ධය පිළිබඳ කරුණු අදහස් ඇතුළත් දේශනා හඳුනා ගැනීම සිදු කෙරේ. එහි දී අට්ඨකථා, ප්‍රකරණ ආදියෙහි කරුණු බහුල වුව ද ත්‍රිපිටක පාලිය අවම කරනු පිණිස ය. දේශනා පෙළ ගැස්වීමේදී සූත්‍ර - අභිධර්ම විනය යන පිළිවෙලින් එය සිදු කර ඇත.

## 1. තෙවිජ්ජ සූත්‍රය

උත්තම චර්යාව පිළිබඳ සාකච්ඡා කරන මෙම සූත්‍රයෙහි බ්‍රහ්ම සහව්‍යතාවට නියම මග බ්‍රාහ්මණ ධර්යෙහි නොමැති බව සහේතුකව පෙන්වා දෙනු ලබයි. එහිදී බුදුරදුන් මෙසේ වදාරයි.

"වාසෙට්ඨ, බමුණන් බ්‍රහ්ම සහව්‍යතාවයට උචිත මග අතහැර ඊනියා මාවතක යනු පෙනේ. බ්‍රාහ්මණයෝ උත්සාහය, වීර්යය හා නිවැරදි ප්‍රතිපදාව අතහැර, ආයාචනය මගින් බ්‍රහ්ම සහව්‍යතාවය පතති. එහෙත් බ්‍රහ්ම සහව්‍යතාවට අවශ්‍ය කාමයෙන් වෙන්වීම යි. බ්‍රාහ්මණයෝ අනලස්බව අතහැර කාමයෙන් මුසපත්ව අලසව සිටිති. එය උපමාවකින් මෙසේ පවසමි. වාසෙට්ඨ, මේ අචිරවතී නදිය ඉවුර තෙක් පිරී ඉතිරී ගොස් ගොඩබිම සිටින කපුටකුට ගඟදිය පානයට තරම් උස්ව ගලායන කල්හි එතෙරට යනු රිසි මිනිසකු පැමිණ මෙගොඩට වී හිසෙහි සිට පොරවාගෙන (සසීසං පාරුපිත්වා) වැතිර සිටී නම් ඔහුට ගඟින් එතෙර වීම සිතීමටවත් හැකි ද? "නැත ස්වාමීනි, ඔහුට එතෙර විය නොහැක." බ්‍රාහ්මණය, එසේ ම පංචනීවරණයෝ (බුද්ධාදී) ආර්‍ය විනයෙහි ආවරණ, නීවරණ, ඔනාහන, පරියොනාහන යනුවෙන්

හැඳින්වේ. එනම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණ යි. මෙම නිවරණ මගින් බ්‍රාහ්මණයෝ ආවරණය වී, වැසීගොස්, ඊට අවනතව, මුළුමණින් සිත වසාගෙන සිටිති. එම නිසා ඔවුන්ව බ්‍රහ්ම ලෝකුගමනයට බාධා සහිතව ම ඔවුහු වාසය කරති.

පංචනීවරණයෙන් සිත වැසුණු අය බඹලොව ඉපදීම සිදු නො වන්නකි.''[5]

මෙහි ථීනමිද්ධය ප්‍රමුඛ නීවරණ හඳුන්වා ඇත්තේ හිස පටන් වසාගෙන නිදන මිනිසෙකුට ය. ඉන් පුරුෂ වීර්‍ය්‍ය අකර්මණ්‍ය වී සියලු උත්සාහ ව්‍යාපෘවන අන්දම විග්‍රහ කරයි.

## 2. සිගාල සූත්‍රය

සදිසා නමස්කාරය අරබයා සිගාල තරුණයාට දෙසී ය. එහි භෝග විනාශ මුඛ හයක් දක්වමින් හඳුන්වා ඇත්තේ ද ථීනමිද්ධය ම ය. එහි ථීනමිද්ධය හඳුන්වන්නේ ''ආලස්‍යානුයෝග' යනුවෙනි. යමෙකු සිය කටයුතු අත්හරින, කල් දමන්නට දක්වන හේතු හයක් එහි දක්වයි. එනම්, අති සීත ය, අතිඋණුසුම් ය, ඉතා සවස් වී යැයි කියා, ඉතා උදැසන යැයි, ඉතා බඩගිනියැයි, ආහාර ගත්තා වැඩි යැයි කියමින් වැඩ කල් දැමීම යි. මෙහි ආලස්‍යානුයෝග රූපී ථීනමිද්ධය භෝග විනාශ මුඛ ලෙස දක්වයි.[6]

## 3. සංගීති සූත්‍රය

සාරිපුත්ත මහරහතන් වහන්සේ සංගායනා ස්වරූපයෙන් දේශනා කළ මෙම සංගීති සූත්‍රයෙහි ධර්ම කාරණා ස්වරූපයෙන් ථීනමිද්ධය විග්‍රහ කෙරේ. සූත්‍රය අරඹන්නේ ඇවැත්නි, අප භාග්‍යවතුන්වහන්සේ මැනවින් දේශිත, නිවනට හේතු වන, නුඹලා විසින් විවාද රහිතව වැඩිය යුතු, බඹසර සුරකින බොහෝ දෙනාට හිතසුව පිණිස පවතින ධර්මයෝ කවරහුද?.... යනුවෙන් දක්වමිනි. ඉන්පසු 1 - 10 අංක යටතේ කරුණු ගොනු කිරීමක් සූත්‍රයෙහි දක්නට ලැබෙයි. **පඤ්ච නීවරණානි** - කාමච්ඡන්දනීවරණං......ථීනමිද්ධ නීවරණං... යන මෙහි ථීනමිද්ධය නීවරණයක් සේ දක්වයි.[7] **සත්ත අසද්ධම්මා - ඉධාවුසො භික්ඛු අස්සද්ධො හොති....... කුසීතො හොති**[8] යන මෙහි අසද්ධර්ම හතක් දක්වමින් ථීනමිද්ධය හඳුන්වා ඇත්තේ ''කුසීත'' යනුවෙනි. එහි දි කුසීතකම ආනායර්‍ය්‍ය දහමක් බව දක්වයි.[9] **අට්ඨ කුසීත**



**වත්ථූනි** - යනුවෙන් කරුණු අටක් මගින් ථීන මිද්ධය උපදවාගන්නා ආකරය දක්වයි.

i). කළයුතු වැඩක් ඇති කල්හි එය නොඅරඹා ම වැඩ කිරීම මහන්සියකැයි සිතා උත්සාහය අත්හරී.

ii). වැඩක් කර අවසන් වූ විට මහන්සිගෙන වැතිරෙයි. නැවත කළයුත්තට උත්සාහ නො කරයි.

iii). ගමනක් යාමට ඇත් කල්හි, ගමන් යාම වෙහෙසකර බව සිතා ගමන නවතා දමයි. උත්සාහ නො කරයි.

iv). ගමනක් ගිය පසු තමා බොහෝ වෙහෙස වී යැයි සිතා වැතිර ගනී. උත්සාහ නො කරයි.

v). ගමකට හෝ නගරයකට පිඩු සිඟා යන භික්ෂුවකට ප්‍රණීත හෝ නිරස හෝ බොජුන් කිසිවක් නො ලැබෙයි. ඉන් අධෛර්‍ය්‍ය වන හෙතෙම කාය බලය නැතැයි පවසමින් අනුත්සාහීව වැතිරගනී. මෙය හයවන කුසීතවත්ථුව යි.

vi). (එසේම) පිඩු සිඟා යන භික්ෂුවකට ප්‍රමාණවත් ආහාර ලැබ වළඳා, ඉතා කුස පිරී ශරීරය බර යැයි පවසමින් අනුත්සාහීව වැතිර ගනී. මෙය හයවන කුසීත මූලය යි.

vii). භික්ෂුවකට සුලු ආබාධයක් සැදී ඇති අතර ඔහු ඉන් අනුත්සාහීව සියලු වැඩ අතහැර වැතිර නිදයි.

viii). භික්ෂුවක් ගිලන්බවින් නැගිට නොබෝ කල් ඇත්තාහු නුදුරු කලකදී ම ලෙඩ වී සිටි තමාට වැඩ කළ නොහැකි බව පවසමින් අනුත්සුක වීම, යනු එම කුසීත වත්ථු අට යි.

## 4. දසුත්තර සූත්‍රය

එකේ සිට දහය උපරිම කොට කරුණු අවධාරණ කරන ''දසුත්තර'' සූත්‍රය ද ''සැරියුත්'' හිමිගේ ම භාෂිතයකි. එහි අවස්ථා කීපයකදී ම ''ථීනමිද්ධය'' විග්‍රහ කර ඇත.

**පඤ්ච ධම්මා පහාතබ්බා** - ප්‍රහීණ කළ යුතු ධර්ම පහකි. (එනම්) පංච නීවරණ යි.[10] මෙහි ථීනමිද්ධ නීවරණය ප්‍රහීණ කළයුතු ධර්මයක් සේ දක්වයි. **කතමෙ සත්ත ධම්මා හානභාගියා** ? යන්න දක්වමින් අසද්ධර්ම හත පිරිහීමට හේතුවන ධර්ම ලෙස දක්වමින් එහි ''කුසිතො හොති'' යනුවෙන් කුසීත කම හානභාගීය ධර්මයක්

ලෙස දක්වයි.[11] කුසීතකම ථීනමිද්ධයට ම සමාන තත්ත්වයකි. එසේ ම අටවැදෑරුම් හානභාගීය ධර්ම දක්වමින් කුසීතවත්ථු අට (8) හානභාගීය ධර්ම ලෙස දක්වයි.[12] **උප්පාදෙතබ්බ** ධම්ම යන්න විස්තර කරමින් දසුත්තර සූත්‍රයෙහි අටවැදෑරුම් උප්පාදෙතබ්බ ධම්ම යටතේ ''අට්ඨමහාපුරිස විතක්ක'' දක්වයි. එහි දී ''ආරද්ධ විරියස්සායං ධම්මෝ නායං ධම්මෝ කුසීතස්ස'' යනුවෙන් සිත තුළ උපදවා ගත යුතු විතර්කයක් සංකල්පයක් ලෙස වීර්යය දක්වයි. වීර්යයට ප්‍රතිපක්ෂ ධර්මය ලෙස එහි කුසීතකම දක්වයි.[13]

## 5. මහා සතිපට්ඨාන සූත්‍රය

දීඝනිකාය හා මජ්ඣිම නිකාය යන දෙකෙහි ම මෙනමින් සූත්‍රය බැගින් ඇත. එම දෙකෙහි ම ධම්මානුපස්සනාව තුළ ''නීවරණ පබ්බයෙහි'' ථීනමිද්ධය විශ්ලේෂණය කර ඇත. එහි දී ථීනමිද්ධයේ යථා ස්වභාවය දන - දක ප්‍රහීන කරන අයුරු දක්වයි. එහි ථීනමිද්ධය ප්‍රහීන කිරීම පියවර පහක් යටතේ දක්වයි.

i). සිත තුළ ථීනමිද්ධය ඇති බව දන ගැනීම.
ii). සිත තුළ ථීනමිද්ධය නැති කල්හි එය ද දනගැනීම.
iii). පෙර නූපන් කරුණු පිළිබඳව ථීනමිද්ධය උපදින කල්හි එය ද දනී.
iv). උපන් ථීනමිද්ධය ප්‍රහීන කළ කල්හි එය ද දන ගනී.
v). ප්‍රහීණ කළ ථීනමිද්ධය මතු නූපදින බව ද දන ගනී.

මෙසේ තමා පිළිබඳව ත්, බාහිර ලෝකය පිළිබඳව ත් පවතින සිතුවිලි මත, ඉන් කුමක් හෝ හේතු කාරක වී උපදින ථීනමිද්ධය හඳුනා ගෙන, සියලු ක්ලේශ ධර්මයන්ගේ උත්පාදමය ස්වභාවය දක්වමින් වාසය කරයි.[14]

## 6. සාමඤ්ඤඵල සූත්‍රය

ශ්‍රමණභාවයෙහි ඵල විමසූ කළ ඊට පිළිතුරු ලෙස අජාසත්ත රජුට දේශනා කළ සාමඤ්ඤඵල සූත්‍රයෙහි ''නීවරණ



ප්‍රහාණය'' වෙනම ම දක්වා ඇත. එහි ථීනමිද්ධය ඇතුළු නීවරණ හැඳින්වීමට උපමා පහක් දක්වා ඇත.[15]

i). ණය වූ මිනිසෙකුගේ ණය බර ලෙස.
ii). දඩිව ගිලන්වූවකුගේ රෝගී ස්වභාවයට.
iii). සිරගත වූවකුගේ සිරගත ජීවිතයට.
iv). දාසභාවයට පත්වූවකුගේ දාස ජීවිතයට.
v). කාන්තාර මගකට පිළිපන් අයකුගේ කටුක ජීවිතයට.

නීවරණ සමාන කර ඇත. මෙසේ දක්වමින් නීවරණ ප්‍රහාණය කිරීම අවස්ථා කිහිපයක ම දේශනා කර ඇත.[16]

## 7. භයභෙරව සූත්‍රය

ජාණුස්සෝණි නම් බමුණකුගේ ප්‍රශ්න විචාරීමකට පිළිතුරු ලෙස මෙම සූත්‍රය බුදුරජාණන්වහන්සේ දේශනා කර ඇත. චිත්ත වික්ෂෙපයට, භයට, තැතිගැනීමට, කරුණු සහිත වනසෙනසුන් ඇසුරු කරන භික්ෂූන්ට භය - තැතිගැනීම් ඉපදීමට හේතු හා ඒවා නැතිකරන ආකාර 16 ක් සූත්‍රයෙහි විස්තර කරයි. එහි එක් අංගයක මෙසේ දක්වයි.

> 'බ්‍රාහ්මණය මට' ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයාගේ කුසීතව හීන වීර්ය සහිතව වනසෙනසුන් ඇසුරු කරත් ද, ඔවුන්ට එම කුසීතකම හේතුවෙන් භය තැතිගැනීම් උපදිති යන මෙම සිතුවිල්ල ඇති විය.[17]

## 8. සල්ලේඛ සූත්‍රය

සිතට ගතයුතු ප්‍රතිපදාව විස්තෘත මෙම සූත්‍රයෙහි සල්ලේඛ ප්‍රතිපදාවට ප්‍රතිවිරුද්ධ වූ ලක්ෂණයක් ලෙස ථීනමිද්ධය දක්වයි. ''ථීනමිද්ධය හා කුසීතකම'' නො දියුණු ජනතා ස්වභාවයක් ලෙස සල්ලේඛ සූත්‍රයෙහි දක්වයි.[18]

### 9. මහාසච්චක සූත්‍රය

නිගණ්ඨ ශ්‍රාවකයකු වූ සච්චක විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලෙස මෙම සූත්‍රය දේශිත ය. එහි එක්තැනකදී සච්චක විසින් "ස්වාමීනී, භාග්‍යවතුන්වහන්ස, ඔබ වහන්සේ දවල්ට නිදන සේක්දැ'යි අසයි[19] ඊට පිළිතුරු වූයේ "එසේය, මා ගිම්හාන කාලයේ අවසන් මාසයේ දානයෙන් පසු දහවල් සඟල සිවුර හතරට නවා බිම එලා සිහි ඇතිව දකුණු ඇලයෙන් සැතපෙන බව වදාරයි" එය සම්මෝහ විහාරය නො වේ දැ යි ඇසූවිට. "නින්දෙන් හෝ නො නින්දෙන් "සම්මෝහ විහරණය" මිණිය නො හැක. ආශ්‍රව සහිත බව ම "සම්මෝහ විහරණය යි." තථාගතයෝ දුක්විපාක ඇති ආශ්‍රව යළි නූපදින සේ නැසූ නිසා තථාගත විහරණය අසම්මෝහී බව වදාරති.[20] මෙමගින් ගම්‍යවන්නේ බුදුරදුන් ගිම්හාන කාලයෙහි කාය සැහැල්ලුව පිණිස දිවා කාලයේ සැතපුන ද එය ථීනමිද්ධයෙන් නො කළ බව යි.

### 10. මහා තණ්හා සංඛය සූත්‍රය

ආලෝක සංඥාව ථීනමිද්ධය දුරලන බව ත්, ථීනමිද්ධය විසින් ප්‍රඥාව දුබල කරන බව ත්, සිත තුළ උපක්ලේශයක් ලෙස ථීනමිද්ධය ක්‍රියාත්මක වන බව ත් දක්වයි.[21]

### 11. මහා අස්සපුර සූත්‍රය

මෙහි ථීනමිද්ධ ඇතුළු නීවරණ හඳුන්වා ඇත්තේ, ණයක්, රෝගයක්, බන්ධනාගාර ගතවීමක්, දාස භාවයක්, කාන්තාර මාර්ගයක් වශයෙනි.[22]

### 12. මහාවේදල්ල සූත්‍රය

ථීනමිද්ධය පවතින්නේ අරමුණකට සෘජුව සිත ගෙන යාමට, හැසිරීමට, ඉන් සතුටුවීමට, එහි සුවවිඳීමට හෝ



මධ්‍යස්ථව සිත පවත්වා ගැනීමට අපහසු අවස්ථාවල බව ප්‍රකට කරයි.[23]

### 13. චූලපුණ්ණම සූත්‍රය

අසත්ධම් සමන්නාගත අසත්පුරුෂයාගේ ලක්ෂණ හතක් මෙහි දක්වයි. කුසීතකම ඉන් එකකි.[24]

### 14. සගාථා සූත්‍රය

මහණෙනි, අදහස් අතින් සමාන අය එකට ගැලපේ. එකතුවේ හීන අදහස් ඇති අය හීනයක් සමග ගැලපේ. අසූචි - අසූචි හා එක්වන්නා සේ හීනයක් හීනයන්ට ම එකතු වේ. මෙය අතීතයේ ද සිදුවිය. දැනුදු එසේ ම ය. අනාගතයේ ද එසේ වනු ඇත.

උසස් අදහස් ඇති ප්‍රණීත පුද්ගලයන් එවැන්නන් හා සැසඳේ., ගැලපේ.. එක්වේ. කිරි කිරි සමග ගැලපෙන්නාක් මෙන්, තෙල් තෙල් සමග එක්වන්නාක් මෙන් පැණි-පැණි සමග එක්වන්නාක් මෙන්, ගිතෙල් - ගිතෙල් සමග එක්වන්නාක් මෙන්, මී පැණි - මී පැණි සමග සැසඳෙන්නාක් මෙන් උසස් පුද්ගලයෝ එකිනෙකා එක්ව වාසය කරති. මෙය තුන්කල්හි ම මෙසේ ය.[25] හීන පුද්ගල සේවනයෙන් කෙලෙස් වැඩේ. හීනයන් නො ඇසුරෙන් කෙලෙස් දිරා යයි. කුඩා දරකඩක් ගෙන (ඔරුවකින්) මහා සයුරක් තරණය කරන්නට යන්නා ජලය මැද ගිලෙයි. එසේ ම කුසීතයා ඇසුරෙන් යහපත් මිනිසා ද පිරිහෙයි. විනාශ වෙයි.[26]

### 15. දුතිය දසබල සූත්‍රය

මහණෙනි කුසීතයා (ථීනමිද්ධ සහිත අය) දුකසේ කල් ගෙවයි. (ඔහු දුක් නො ඉක්මවූවේ වෙයි) ඔහු පාපී අකුසල ධර්මයන් සහිතව ම වාසය කරයි. මහත් වූ අර්ථයන් විනාශ කර ගනියි.[27]

16. දුතිය ඔවාද සූත්‍රය

මහා කාශ්‍යප මහරහතන් වහන්සේ මෙසේ වදාරති. ස්වාමීනි, අවපක්ෂය පැමිණි කළ දිනපතා දවල් ර දෙකෙහි සඳෙහි වණය ද අඩු වේ. මණ්ඩලය බැබලීම ද ප්‍රමාණය ද අඩු වේ. ස්වාමීනි, එසේ ම යමෙකුට කුසල් දහම් වඩන්නට වීර්ය නැද්ද, (ථීන මිද්ධය උත්සන්න ද) ඔහු දිනපතා කුසලයෙන් පිරිහේ. කෙසේ ද? යත් කාල පක්ෂයෙහි සඳ මෙනි.[28]

17. කුසිත සූත්‍රය

කරුණු පහකින් යුතු කාන්තාව මරණින් මතු දුගතියෙහි උපදියි. එම කරුණු පහ නම් ශ්‍රද්ධාව නැතිකම, පවට ලැජ්ජා නැති බව, පවට භය නැතිකම, කම්මැලි වීම, මොට සිහි ඇතිව අනුවණ සහගත වීම යි.[29]

18. නීවරණ සූත්‍රය

"මහණෙනි, මේ පහ නීවරණ නම් වේ. එනම් කාමච්ඡන්ද නීවරණය. ව්‍යාපාද නී., ථීනමිද්ධ නී., උද්ධච්ච කුක්කුච්ච නී., විචිකිච්ඡා නී. යන පහ යි.[30]

19. නීවරණ සූත්‍රය

"මහණෙනි, ථීනමිද්ධය නීවරණයකි. එය අන්ධකරණීය ය. අචක්ඛු කරණීය ය, අඤ්ඤාණ කරණී ය ය, පඤ්ඤා නිරෝධික ය, විඝාතපාක්ෂික ය, අනිබ්බාන සංවත්තනික ය.[31] මෙහි ථීන මිද්ධයේ හානිකර ස්වභාව හයක් පෙන්වයි.

I. **අන්ධකරණීයභාව** - ථීනමිද්ධය බලවත්ව, කුසල් නො වැඩූ කල්හි රාග ද්වේශ, මෝහ, මාන, දිට්ඨි, කෙලෙස් දුසිරිත් උත්සන්න වී සත්ත්‍ව වසා ලන ස්වභාවය ථීනමිද්ධයෙහි පවතී.[32]



II. **අචක්ඛුකරණියතාවය** - රාග, දෝෂ යනාදිය උත්සන්නව ප්‍රඥාව පහළවීම වළකාලන බව.

III. **අඤ්ඤානකරණියතාවය** - රාග දෝස යනාදිය නිසා අනවබෝධය තීව්‍ර කරන බව.

IV. **පඤ්ඤානිරෝධිකතාව** - රාගදෝසාදිය මගින් අවබෝධය වළකාලන බව.

V. **විඝතපාක්ෂිකතාව** - රාගදෝසාදිය මගින් දුක් උපදවන බව සහ එබඳු කෙලෙස් පැවතීම දුක් සහිත බව.

VI. **අනිබ්බානසංවත්තනිකතාව** - නිවන් වළකන බව, යන ගති ලක්ෂණ ථීන මිද්ධයෙහි ඇත.

20. අග්ගි සූත්‍රය

"මහණෙනි යම් කලෙක **'ලීන සිත'** (උදාසීන සිත) පවතී ද එකල්හි පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සම්බොජ්ඣංග වැඩීම කළ නො හැකි ය. මක් නිසා ද යත්? උදාසීන සිතක එම ධර්මයන් නූපදින බැවිනි."[33] ඒ අනුව ථීනමිද්ධය මානසික සන්තෘෂ්ඨියට සහ එකගකමට බාධාවක් බැව් පෙනේ.

21. කාය සූත්‍රය

ශරීරය ආහාර නිසා පවතින්නාක් මෙන් පංචනීවරණයන් ද ආහාර නිසා පවතී. මහණෙනි... නුපන් ථීනමිද්ධය ඉපදීමට සහ උපන් ථීනමිද්ධය වඩිනයට බලපාන හේතු කවරේ ද? මහණෙනි, **අරති තන්දි, විජම්භිතා, භත්තසම්මද, චෙතසො ලීනත්තතාව** හා **අයෝනිසො මනසිකාරය** ථීනමිද්ධයට පහසුකම් (ආහාර) සපයයි.[34] (මෙම වචන ථීනමිද්ධයට සමානාර්ථ සපයයි. (2. හි විස්තර කර ඇත.)

22. ආහාර සූත්‍රය

ඉහත 'කාය සූත්‍රයේ' ලෙසට ම මෙහි ද ථීනමිද්ධය හඳුන්වා ඇත. වෙනස ථීනමිද්ධයට අනාහාර- හේතු නො වන දේවල් ද දක්වා තිබීම යි.[35]

## 23. ආවරණ නීවරණ සූත්‍රය

මහණෙනි, ආවරණ, නීවරණ නම් වූ සිත කිලිටි කරන අවබෝධය දුරස්කර කරන ධර්ම පහකි. එනම්, කාමච්ඡන්ද.... ථීනමිද්ධය... යි.[36]

## 24. රුක්ඛ සූත්‍රය

මහණෙනි, ඇසතු, නුග, පිළ, දිඹුල් ආදී මහා කඳන් වැඩෙන ශාක තවත් ගහක් මත හැදී වැඩී මුල්ශාඛය බිම හෙලයි, වසා ගනියි. ථීන මිද්ධය ද එසේ ම ය. එය උපන් තැනැත්තා වසා ගනියි.[37]

## 25. පරියාය සූත්‍රය

පංචනීවරණ හා සත්ත බොජ්ඣංග, දහයක් හා දාහතරක් වනයුරු දේශිත සූත්‍රයකි. මෙම පර්යාය දේශනාව විශ්වයෙහි සිටින බුදුවරයකු හැර අන් කවරෙකුටවත් පෙන්වාදිය නො හැකි බව ද එහි ම දක්වෙයි. ඒ අනුව 'ථීනය' නම් යමක් වේ ද එය ද නීවරණයකි. 'මිද්ධය' නම් යමක් වේ ද එය ද නීවරණයකි. ඒ අනුව ථීන ද නීවරණ ය. මිද්ධ ද නීවරණ ය.[38]

## 26. අකුසල රාසි සූත්‍රය

මහණෙනි, අකුසලයන්ගේ එක්තැන්වීම යනුවෙන් යමකට කියයි නම් එම නම පංච නීවරණයන්ට ගැලපේ. මහණෙනි, මේ පංච නීවරණ මුළුමණින් ම අකුසල් එකතු කරන්නේ ය.[39]

## 27. අභය සූත්‍රය

"යමක් අනවබෝධවීමට හෝ අවබෝධ නො වීමට හේතු ඇත.... ථීනමිද්ධය උත්සන්නව යම් විටක සිටී ද, ථීන මිද්ධය නසන හැටි නො දනී ද, එකල්හි නො දැක්ම හා අනවබෝධය හටගනී.[40]



## 28. භරියා සූත්‍රය

අලසකම් ඇති, වැඩ කිරීමට අකමැති භාර්යාව නපුරු බස් හා රළු පැවතුම් ඇතිව ස්වාමියා මැඩ පවත්වා ගෙන වාසය කරන බව ත්, ඇය 'ස්වාමි භාර්යාව' ලෙස ත් දක්වා ඇත.[41]

## 29. අච්ඡරා සංඝාතවග්ගයේ (අං.නි.1) 10 සූත්‍රය

මහණෙනි, කුසීතකම තරම් නූපන් අකුසල් උපදවන උපන් කුසල් නසා දමන අන් යමක් මා නො දකිමි. කුසීතකම එතරම් ප්‍රබල ය.[42]

## 30. අං. නි. 1.16.3.10 සූත්‍රය (317 සූත්‍රය)

"මහණෙනි, නිවැරදිව දෙසූ ධර්මය සහිත ශාසනයක සිටින කුසීතයා දුකසේ වෙසේ. ඒ, ධර්මය ස්වාක්ඛාත ලෙස දේශිත බැවිනි."[43] එම සූත්‍රයෙහි ම අට්ඨකථාව කුසීතයාගේ දුක් සහිත ජීවිතය අර්ථ විවරණය කරයි. මෙහි දුකසේ විසීම යනු මෙලොව හා පරලොව දුකසේ විසීම යි. පැවිදි වූ කළ පටන්, සිහිය පිහිටුවා නැති, බුදු වදන් නූගත්, වතාවත් නො කරන මිනිසුන් දුන් දේ ප්‍රත්‍යවේක්ෂා නො කොට වළඳා දිවා කල නින්දෙන් හා ඉන්ද්‍රිය සන්තර්පනයෙන් සිට පිබිදුණු කල්හි ත්‍රිවිධ විතර්ක ම සිතන තැනැත්තා නොබෝ කලකින් ම සිවුරු ද හැර යයි. ඉන් මෙලොව ම දුක් විඳී. ශ්‍රමණ ධර්ම නො කළ නිසා කය බිඳී දුගතියට ද යයි.[44]

## 31. චර සූත්‍රය

මහණෙනි, භික්ෂුවක් ඇවිදින විට හෝ හිටගෙන, හිඳගෙන, නිදන විට හෝ කුමන අවස්ථාවකදී හෝ උපනුපන් කාම, ව්‍යාපාද, විහිංසා විතර්ක ඉවසයි ද නුදුරලයි ද, නො රඳයි ද, ඉවත් නො කරයි ද, අභාවයට පත් නො කරයි ද කෙලෙස් නොතවන ඔහුට 'කුසීතයා' යැයි කියනු ලැබේ.[45]

## 32. අස්සද්ධ සූත්‍රය

මහණෙනි, මෙලොව යමෙක් කුසීත ද, ඔහු අසත්පුරුෂයෙකි. යමෙක් කුසීතව සෙසු අය ද කුසීත කරයි ද, ඔහු **'අසත්පුරුෂතරයා'** යැයි කිව යුතු ය.[46]

## 33. අස්සද්ධ සූත්‍රය. (අං.නි. 5 නිපාතය)

මහණෙනි, කරුණු පහක් සහිත භික්ෂුව එක්ව වසන අයට අප්‍රිය, අමනාප වෙයි. ගරු නො කරන්නේ වැඳුම් පිදුම් නො කරන්නේ ද වෙයි. කවර කරුණු පහක් ඇති භික්ෂුව ද යත්, ශ්‍රද්ධාව නැති, පවට ලජ්ජා නැති, පවට භය නැති, කුසීත වූ දුෂ්ප්‍රාඥ භික්ෂුව යි.[47]

## 34. දුස්සීල සූත්‍රය

මහණෙනි, මෙම කරුණු හතර ඇත්තා මිය ගොස් ඔසවා තැබූවකු සේ වහා ම නිරයේ උපදී. එනම්, අශ්‍රද්ධාව, දුස්සීල බව, කම්මැලිකම, දුෂ්ප්‍රාඥ බව යන කරුණු ඇත්තාය.[48]

## 35. දුප්පඤ්ඤා සූත්‍රය - මෙය ද දුස්සීල සූත්‍රයට ම සමාන ය.[49]

## 36. දුක්ඛ සූත්‍රය

කරුණු පහකින් යුතු භික්ෂුව මෙලොව ම දුකසේ වසයි. මානසික දුක් සහිතව, දැවිලි සහිතව, බැඳීම් සහිතව වසයි. කය බිඳී මරණින් මතු දුගතියට යාමට ද සූදානමින් සිටිය යුතු ය. එනම් අශ්‍රද්ධාව, අහිරික, අනොත්තප්පය, කුසීත, දුප්පඤ්ඤ යන ලක්‍ෂණ සහිත භික්ෂුව යි.[50]

## 37. යථාභත සූත්‍රය

කරුණු පහකින් යුතු භික්ෂුව මැරුණු සැනින් නිරය ගාමී වන බව දක්වයි. (එහිදී ඉහත කරුණු පහ ම දක්වයි)[51]



## 38. වචන සූත්‍රය

කරුණු පහකින් යුතු භික්ෂුව උපැවිදි වෙයි. සසුන හැරයයි. ධර්මයෙහි නො පිහිටයි. (දුක්ඛ සූත්‍රයේ කරුණු පහ දක්වයි)[52]

## 39. පඨම අගාරව සූත්‍රය

දුක්ඛ සූත්‍රයෙහි දක්වන කරුණු පහ ඇති භික්ෂුව ගරු සරු නැත්තේ පිහිට රහිත වූයේ සසුන හැර යන බව දක්වයි.[53]

## 40. දුතිය අගාරව සූත්‍රය

එම කරුණු පහ ම සහිත භික්ෂුව ගරුසරු නැත්තේ, පිහිට රහිත වූයේ වර්ධනයට, දියුණුවට නො යන්නෙක්ව පිරිහෙන බව දක්වයි.[54] (මේ සැම තැන ම කුසීතකම එම කරුණු පහෙන් එකකි.)

## 41. සාරජ්ජ සූත්‍රය

මේ නමින් සූත්‍ර තුනකි. ඒ අතරින් කුසීතකම දක්වන්නේ (අං.නි. 5) සද්ධර්ම වග්ගයේ මෙම සූත්‍රය යි. ඊට අනුව කරුණු පහක් ඇත්තේ කෙලෙස් දුහුවිලි වලින් නැහැවෙන්නේ වෙයි. කුසීතකම ඉන් එකකි.[55]

## 42. අග්ගධර්ම සූත්‍රය

කුසීතකම ඇත්තා අග්‍රධර්මය වන රහත්බව සාක්‍ෂාත්කරණයට හැකියාව නැත්තෙකි.[56]

## 43. රත්තින්දිව සූත්‍රය

කුසීතකම ඇත්තා දහවල් ද රෑ ද කුසලයේ පරිහානියට කැමති විය යුතු ය. වර්ධනයක් බලාපොරොත්තු නො විය යුතු ය.[57]

**44. අසද්ධර්ම සූත්‍රය** - කුසීතකම අසද්ධර්ම හතෙන් එකකි.[58]

**45. බල සූත්‍රය** - කුසීතයා දුගතියට බිය විය යුතු ය.[59]

**46. සචිත්ත සූත්‍රය**

යමෙකුට 'පරචිත්ත පරියාය කුසලය' නැත්නම් 'සචිත්ත පරියාය කුසලය' උපදවා ගත යුතු ය. තම සිත තුළ පවතින්නේ ථීනමිද්ධය ද, වීර්යය ද යන්න දැන ගැනීම ද සචිත්ත පරියාය කුසලයකි.[60]

**47. සාරිපුත්ත සූත්‍රය**

සැරියුත් හිමියන් විසින් දේශිත මෙහි ඉහත කරුණු ම ඇතුළත් වෙයි.[61]

**48. ආනන්ද සූත්‍රය**

කරුණු දහයක් ඇති භික්ෂුව සසුනෙහි වෘධියට නො හේ. කුසීතකම ඉන් එකකි.[62]

**49. කොසජ්ජ සූත්‍රය. (අං.නි.1)**

මහණෙනි, මා කුසීතකම තරම් හානිකර වූ අන් එකදු ධර්මයක්වත් නො දකිමි.[63]

**50. අජ්ඣත්තිකාංග සූත්‍රය. (අං.නි. 1)**

මහණෙනි, කුසීතකම තරම් හානි කරවූ, පුද්ගලාභ්‍යන්තරයෙහි පවතින අන් කිසිදු ධර්මයක් මා නොදකිමි.[64]



**51. සද්ධර්ම අන්තරධාන සූත්‍රය**

මහණෙනි, මා සද්ධර්මයෙහි අන්තර්ධානය පිණිස පවතින විනාශය පිණිස පවතින කුසීතකම තරම් වූ අන් එකදු ධර්මයක්වත් නො දකිමි.[65]

**52. සමාපත්ති සූත්‍රය**

.... මහණෙනි, කුසල ධර්මයන් පිළිබඳව වීර්යය පවතිනතාක් අකුසල ධර්මයන්ගේ නැගී සිටීම සිදු නො වේ. යම් කලෙක කුසල ධර්ම ප්‍රතිබද්ධ වීර්යය හීන වේ ද, කුසීත වේ ද එකල්හි ම අකුසලයන්ගේ නැගිසිටීම සිදු වේ.[66]

**53. අනාගාමි ඵල සූත්‍රය**

මහණෙනි, කුසීතකම ප්‍රහීණ නො කොට අනාගාමිඵලයට පත්විය නො හැක... කුසීතකම ප්‍රහීණ කොට අනාගාමිඵලයට පත්විය හැක.[67]

**54. අරහත් සූත්‍රය**

කරුණු හයක් ප්‍රහීණ නො කොට රහත්විය නො හැක. එනම් ථීනය, මිද්ධය, උද්ධච්චය, කුක්කුච්චය, අශ්‍රද්ධාව, ප්‍රමාදය යන හය යි. මෙම කරුණු හය පහ කිරීමෙන් රහත් විය හැකි ය.[68]

**55. මළ සූත්‍රය**

මහණෙනි, මළ අටකි. ශරීර වර්ණයට/ බැබලීමට කුසීතකම මළයකි. (බාධාවකි/ මළකඩයකි)[69]

**56. තයොධර්ම සූත්‍රය**

මහණෙනි, අශ්‍රද්ධාව, මිච්ඡාචාර, කුසීතකම යන කරුණු තුන පහ නො කොට උද්ධච්චය, අසංවරය, දුසිල්වත් බව යන ධර්ම පහ කළ නො හැකි ය.[70]

## 57. කුසීතාරම්භවත්ථු සූත්‍රය

කුසීතවස්තු අටකි. (කම්මැලිකමට මුල්වන කරුණු අටකි)

I. තමාට ඉදිරියෙන් බොහෝ වැඩ ඇතැයි සිතමින් එසේ බොහෝ වැඩ කරන විට මහන්සිය උපදින නිසා දැන් මම මදක් විවේක ගත යුතු යැයි සිතා සැතපෙයි. වීයර්‍ය නො කරයි.
II. වැඩක් කළ පසු තමා බොහෝ වැඩ කිරීමෙන් කය විඩා බර වූ බව සිතමින් සැතපෙයි.
III. ගමනක් යාමට ඇති විට ඒ ගැන සිතා පූර්ව සූදානමක් ලෙස වැතිර ගැනීම.
IV. ගමනක් ගිය පසු එහි විඩාව සැමරීමට විවේක ගැනීම.
V. නිසි ආහාර නො ලද කල කුසීත වෙයි
VI. පිරිපුන් අහර ලද විට ද කුසීත වෙයි.
VII. කුඩා ආබාධයක් උපන් කල කුසීත වෙයි.
VIII. ලෙඩක් තිබී සුව වූ පසු කුසීත වෙයි.[71]

## 58. තයොධම්ම සූත්‍රය. (අං.නි.10)

මහණෙනි, පවට ලැජ්ජා නැත්තා, පවට භය නැත්තා ප්‍රමාදී වෙයි. එසේ පවා වූ ඔහු වෛරී සිත, දුර්වචන, පාපමිත්‍ර සේවනය, අශ්‍රද්ධාව, වදන්හි අසංවිධිත බව, කුසීතකම ඇත්තේ වෙයි. කුසීත වූ හෙතෙම උද්ධච්චය, අසංවරය, දුසිල්බව දුරලීමට අසමත් ය. දුස්සීල වූ හෙතෙම එකටෙක කරන සුළු ගතිය ප්‍රහීණ කිරීමට ද අසමත් වෙයි. උපාරම්භ (එකටෙක කරන) සිත් ඇති හෙතෙම මොට සිහිය නො වැටහෙන නුවණ, චිත්ත විපිළිසරකම ප්‍රහාණයට නොහැකි අයෙකු වෙයි. එසේ වූ හෙතෙම අයෝනිසෝ මනසිකාරය, මිත්‍යාමාර්ග සේවනය, සිතෙහි හැකිළුණු (කුසීත) කම ප්‍රහීණත්වයට නුසුදුසු වෙයි. හෙතෙම ජාති, ජරාදිය ප්‍රහාණයට නුසුදුසු ය.[72]



## 59. නීවරණ සූත්‍රය. (අං.නි.9)

මහණෙනි, නීවරණ පහකි. එනම් කාමච්ඡන්ද නීවරණය, ථීනමිද්ධ නීවරණය යන පහ යි. මෙම නීවරණ ප්‍රහාණයට සතර සතිපට්ඨානය වැඩිය යුතු ය.[73]

## 60. නීවර්ණප්‍රහාණ වර්ගය

ථීනමිද්ධයෙහි උපතට බලපාන, අරතිය, තන්දි, විජම්භිතා, ... සිතෙහි හැකිළුණුකම යන කරුණු තරම් අනෙකක් නැත.[74]

## 61. ආවරණ සූත්‍රය

සිතට කාවැදී ප්‍රඥාව දුර්වල කරන ආවරණ, නීවරණ පහකි. ථීනමිද්ධය ආවරණයකි. නීවරණයකි. යමෙක් මෙම නීවරණ ප්‍රහීණ නො කොට, ප්‍රඥාව බලවත් නොවී දුර්වලව තිබියදී ස්වාර්ථය හෝ පරාර්ථය හෝ උභයාර්ථය හෝ උත්තරීතර මිනිස් ධර්ම හෝ ලබාගනිතැයි යන්න සිතීමටවත් නො හැක.[75]

## 62. අකුසල රාසි සූත්‍රය

යමකින් අකුසල් එක්රැස් වේ නම් ඒ පංච නීවරණ වලින් යැයි කියන්නාහු මැනවින් ප්‍රකාශ කරන්නෙකි.[76]

## 63. අවිජ්ජා සූත්‍රය. (අං. නි. 10)

මහණෙනි, අසත්පුරුෂ සේවනයෙන් අසද්ධර්ම ශ්‍රවණය පිරෙයි. අසද්ධර්ම ශ්‍රවණයෙන් නොසැදැහැය පිරෙයි. එමගින් නුසුදුසු තැන්හි මෙනෙහිකිරීම් උපදී. එමගින් සති සම්පජඤ්ඤ නොමැති බව පිරේ. එමගින් ඉන්ද්‍රිය අසංවරය ද ඒ හරහා ත්‍රිවිධ දුසිරිත් ද ඉන් පංචනීවරණ ද, එමගින් අවිද්‍යාව ද පිරේ. මෙසේ අවිද්‍යාවට ආහාර ලැබේ. මහණෙනි, කඳු මුදුනට ලොකු දිය බිඳු සහිත වර්ෂාව ඇද වැටෙන කල්හි එම ජලය බෑවුම අනුව

හෙලට ගලා විත් කඳු මුදුනේ කඳුරු, පොලොවේ පැල්මවල්, දිය උල්පත් පුරවන්නේ ද, ඉන්පසු කුඩා දියවලවල් පුරවන්නේ ද, කුඩා දියවලවල් පිරවීමෙන් පසු මහ දිය වලවල් පුරවන්නේ ද මහ දියවලවල් පුරවා කුඩා නදී පුරවන්නේ ද, කුඩා නදී පුරවා මහනදී පුරවන්නේ ද මහනදී පුරවා සාගරය, මහසයුර පුරවන්නේ ද වෙයි. මහ සයුර ආහාර ලබාගන්නේ එසේ ය. මහණෙනි, එමෙන් ම අසත්පුරුෂ ..... නීවරණ සම්පූර්ණ කරයි. පංචනීවරණ අවිද්‍යාව සම්පූර්ණ කරයි.[77]

## 64. භවතණ්හා සූත්‍රය

ඉහත කරුණු ම සම්පූර්ණ වීමෙන් අවිද්‍යාව සපිරී ඒ හරහා භවතන්හාව සපිරෙන බව දක්වයි.[78]

## 65. පඨම තජ්ඣාන සූත්‍රය

මහණෙනි, කාමච්ඡන්දය...ථිනමිද්ධය.. පහ නො කොට, ආදීනව නුවණින් නො දක පළමු ධ්‍යානය ලබා ගත නො හැකි ය.[79]

## 66. මහාකළථෙරවත්ථු (ධ.ප)

කාමාදි අරමුණු ශුභ වශයෙන් දකිමින් ඉන්ද්‍රිය අසංවරව අහරෙහි පමණ නො දන හීන වූ වීර්‍ය ඇතිව කම්මැලිව සිටින්නා මාරයාට නතු වේ. ඒ දුබල රුකක් මහ සුළඟකට නතු වන්නාක් මෙනි.[80]

## 67. පධානකම්මික තිස්සථෙර වත්ථු. (ධ.ප)

උත්සාහ කළ යුතු කාලයෙහි උත්සාහ නො කර ශක්තිය තිබියදී ත් අලසව සිට කුසීත සිතින් යුක්ත වූවාහු අලස වූවාහු ප්‍රඥාවට මග වින්දනය නො කරයි.[81]



## 68. පරාභව සූත්‍රය (සු.නි.)

නිදන සුළු වූ සභාවෙහි ඇළුණු වීර්යය හීන අලස, ක්‍රෝධය ප්‍රකට කරන මිනිසා පිරිහේ.[82]

## 69. රථලට්ඨි, මණිකුණ්ඩල, භූරිපඤ්ඤ, සෝමනස්ස, මහානාරද කස්සප ජාතක (ජා.පා.)

අලසවූ ගිහියා ද සංයමයක් නැති පැවිද්දා ද නොවිමසා වැඩ කරන රජු ද කෝප ගන්නා පණ්ඩිතයා ද යහපත් නො වේ.[83]

## 70. ධාතුසො සංසන්දන සූත්‍රය (ඉති.)

කෙලෙස් සහිත වූවන් හා එක්වීමෙන් ම සිත කිලිටි වේ. කෙලෙස් දුරලීමෙන් සිත පිරිසිදු වේ. යමෙක් කුඩා දරකඩකින් මහ සයුර තරණය කරන්නට යාමෙන් ගිලී මැරෙන්නාක් මෙන් කුසීතයා නිසා හොඳ අය ද අමාරුවේ වැටේ. එබැවින් කුසීතයා දුරලන්න.[84]

මෙම අදහස ම සෝමමිත්ත හා විමල ථෙරගාථාවල ඇත.

## 71. සප්පදාස ථෙර වත්ථු

යමෙක් කම්මැලිකමෙන් අනුත්සාහීව වසර සීයක් ජීවත්වනවාට වඩා වීර්යයෙන් ජීවත්වන එක දිනය උතුම් ය.[85]

## 72. ආතාපි සූත්‍රය

කම්මැලි වූ හීන වීර්ය ඇති ථිනමිද්ධ බහුල අය උතුම් වූ බුද්ධත්වය ලැබීම විරල ය. එය සිදු නො වන්නකි.[86]

ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය
23 JUL 2019

73. පටිසම්භිදාමග්ගය

තථාගතයන්ගේ ඉන්ද්‍රිපරෝපරියත්ත ඤාණයට හසුවන පුද්ගලයන් විස්තර කරන තැන කුසීත පුද්ගලයාගේ ස්වභාවය විස්තර කරයි. එහිදී කුසීත පුද්ගලයා

**මහාරජක්ඛ** - බොහෝ කෙලෙස් ඇති.
**මුදින්ද්‍රියො** - ඉන්ද්‍රි නො දියුණු
**ද්වාකාර** - මනා ස්වරූප නොමැති
**දුවිඤ්ඤාපය** - වහා අවබෝධ කළ නො හැකි.

**න පරලොකවජ්ජභයදස්සාවී** - පරලොව දී වැරදිවලට වන හානියට භය නො වන අය ලෙස විග්‍රහ කර ඇත.[87]

ආලෝක සංඥාව ආර්යත්වයට පත් කරන සංඥාවක් බව ත් එම ආලෝක සංඥාව වැඩීමට බාධා කිරීම ථිනමිද්ධයෙහි ස්වභාවය බව ද' දක්වයි.[88]

**ථිනමිද්ධය පිළිබඳ විනය පිටකයේ දේශනා**

1. කුසීත භික්ෂුව විසින් නවක භික්ෂූන් උපසම්පදා නො කළ යුතු බව දක්වයි.[89]
2. මෙය මහාවග්ග පාලියෙහි අවස්ථා හතරක ම දක්වා ඇත.

**අභිධර්ම පිටකයේ ථිනමිද්ධය පිළිබඳ පර්යායදේශනා**

කොසජ්ජ යන්න (කුසීතකම) හඳුන්වන විභංග පාලිය.

" කුසීතකම යනු, කාය-වචී-මනෝ දුශ්චරිතයන් පිළිබඳව හෝ පස්කම් සැප පිළිබඳව හෝ සිත නො අලවා විසීමට, කුසල් දහම් වැඩීමට, මැනවින් කටයුතු සම්පාදනයට අවහිර කරන, හැකිළුණු සිත් ඇති බව හා කැමැත්ත නැති කරන ගතිය යි. කුසල් දහම් සේවනය නො කිරීම, නො වැඩීම, බහුල නො කිරීම, ඊට අධිෂ්ඨාන නො කිරීම, උත්සාහ නො කිරීම ප්‍රමාදී බව කුසීත කම යි.[90] කුසීතකම අසද්ධර්ම හතෙන් පස්වැන්න ලෙස විභංගය දක්වයි.[91] ථීනය හා මිද්ධය ධම්මසංගිණිය වෙන වෙන ම හඳුන්වයි. ඒ සිතෙහි අකර්මණ්‍යතාව, හැකිළුණු, නිදිලත්,



ඉදිරියට නොයන ගතිය හා චෛතසිකයන්හි ද එම ගතිය වශයෙනි.[92]

## ආන්තික සටහන්

1. තත්‍ථ පරියායොති කාරණං. අයඤ්හි පරියාය සද්දෝ දේශනාවාරකාරණේසු වත්තති. ස.පා., 1. වෙළුම, ස.හේ.මු. මරදාන: 1919. පිටුව 58.
2. මධුපිණ්ඩික පරියායොත්වෙව නං ධාරෙහීති. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 286.
3. කස්ස නු ඛො ආනන්ද අජ්ජ පරියායෝ භික්ඛුනියෝ ඔවදිතං පරියායෙනාති. ම.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 552.
4. සාධු භන්තේ භගවා අඤ්ඤං පරියායං ආචික්ඛතු යථායං භික්ඛුසංඝො අඤ්ඤාය සණ්ඨහෙය්‍යාති. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 104.
5. දී.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 606.
6. අතිසීතං අතිඋණ්හං - අතිසායමිදං අහු ඉතිවිස්සට්ඨකම්මන්තේ අත්‍ථා අච්චෙන්ති මාණවෙ. දී.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 296.
7. දී.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 396.
8. එම. 428
9. .එම. 434
10. දී.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 478.
11. එම.500
12. එම. 508
13. එම. 518
14. I දී.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 468.
    II ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 146.
15. දී.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටු 124-128.
16. I. දී.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 460.
    II. දී.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 80.
    III. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 640.
17. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 42.
18. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 102.

19. අභිජානාති ඛො පන ත්වං දිවා සුපිතාති? අභිජානාමහං අග්ගිවෙස්සන ගිම්හානං පච්ඡිමෙමාසෙ පච්ඡාභත්තං පිණ්ඩපාත පටික්කන්තෝ චතුග්ගුණං සංඝාටිං පඤ්ඤපෙත්වා දක්ඛිණෙන පස්සෙන සතො සම්පජානො නිද්ද ඔක්කමිතාති. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 588.
20. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 588.
21. I. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 630.
    II. ම.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 16.
22. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 642.
23. ම.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 692.
24. ම.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 126.
25. සං.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 244.
26. සංසග්ගා වනථො ජාතො - අසංසග්ගෙන ඡිජ්ජති
    පරිත්තං දාරුමාරුය්හ - යථාසීදෙ මහණ්ණවෙ
    එවං කුසීතමාගම්ම - සාධු ජීවිපි සීදති. එම.
27. සං.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 46.
28. සං.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 314.
29. සං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 456.
30. පඤ්චිමානි භික්ඛවෙ නීවරණානි කතමානි පඤ්ච? කාමච්ඡන්දනීවරණං ...ථීනමිද්ධනීවරණං... සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 136.
31. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 194.
32. සබ්බං රාගතමං දොසතමං මොහතමං මානතමං දිට්ඨිතමං කිලෙස තමං දුච්චරිතතමං අන්ධකරණං.. අනිබ්බානසංවත්තනිකං මහානි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 612.
33. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 216.
34. අත්ථි භික්ඛවෙ අරති තන්දි විජම්භිතා භත්තසම්මදො චෙතසො ච ලීනත්තං. තත්ථ අයොනිසොමනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා ථීනමිද්ධස්ස උප්පාදාය උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස භීයොභාවාය වෙපුල්ලාය. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 142.
35. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 202.
36. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 190. .සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 192.
37. යදපි භික්ඛවේ ථීනං තදපි නීවරණං යදපි මිද්ධං තදපි නීවරණං ථීනමිද්ධං නීවරණන්ති ඉති හිදං උද්දේසං ගච්ඡති තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 212.



38. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 266.
39. සං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 236.
40. අකම්මකාමා අලසා මහග්ඝසා, එරුසා ච චන්ඩි දුරුත්තවාදිනී උට්ඨායකානං අභිභුයවත්තති යා එවරූපා පුරිසස්ස භරියා අයහා ච භරියාති ච සා පවුච්චති. අං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 416.
41. අං.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 22.
42. ස්වාක්ඛාතෝ භික්ඛවෙ ධම්ම විනයෙ යො කුසීතො සො දුක්ඛං විහරති. අං.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 70.
43. අං.නි.අ., 1. වෙළුම, ස.හේ.මු. මරදාන: 1922. පිටුව 146.
44. අං.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 118.
45. අං.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 174.
46. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 324.
47. අං.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 394.
48. අං.නි., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 410.
49. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 12.
50. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 14.
51. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 26.
52. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 30.
53. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 32.
54. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 190.
55. අං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 80.
56. අං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 84.
    . අං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 236.
57. අං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 46.
58. අං.නි., 6. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 280.
59. අං.නි., 6. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 320.
60. අං.නි., 6. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව .
61. අං.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. : පිටුව 78.
62. අං.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 94.
63. අං.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 140.
64. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 28.
65. අං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 154.
66. අං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 138.
67. අං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 42.
68. අං.නි., 6. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 196.

69. අං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 230.
70. අං.නි., 6. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 146.
71. අං.නි., 5. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 160.
72. අං.නි., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 106.
73. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 120.
74. අං.නි., 3. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 126.
75. අං.නි., 6. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 210.
76. එම. 220
77. අං.නි., 4. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 140.
78. ධ.ප. බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 24.
79. ධ.ප., බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 42.
80. සු.නි., බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 28.
81. I. ජාතකපාලි 4 නිපාතය 4.2. රථ ලට්ඨිජාතක.(332)
    II. එම. 5. නිපාතය 1.1 මණිකුණ්ඩල ජාතක. (351)
    III. එම. 10. නිපාතය 14. භූරිදත්තජාතක. (542)
    IV. එම. 20. වීසතිනිපාතය 9. සොමනස්ස ජාතක. (505)
82. ඉතිවු. බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 290.
83. ධ.ප., බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 28.
84. ඉතිවු., බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 230.
85. පටි.ම., බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 320.
86. එම.
87. මහාව., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 80.
88. විභං., 2. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 342.
89. එම.
90. ධ.සං., 1. වෙළුම, බු.ජ. (පුනර්) මු., 2005. දෙහිවල: පිටුව 340.